

## පමා නොවී එම් අකුරට

රසිකා සූරියආරච්චි ලියයි

# කොළඹ කැකිරි



> කාමරයක සිටින එක් අයෙකුට ඇණුමක් ගිය විට, ඒ අසල සිටින අයටද ඇනුම් යාමේ ප්‍රවණතාවක් ඇති බව ලොව පතල කරුණකි. ඒ පැයක කාලය තුළ පන්තියේ සිටි සිසුන් තිස් දෙනා ද ඇනුම් හැටක්වත් අරින්නට ඇත.
> අපේ රසායන විද්‍යාව පාඩම් ඒ තරම්ම රසවත් විය!

උපහාසාත්මක සටන් පාඨයක් ලෙස "කොළඹට කිරි, ගමට කැකිරි" යන්න ලංකා දේශපාලන කරලියේ දෙරට වැඩියේ පසු කලෙක වුවද, අප ද්විතියික අධ්‍යාපනය ලබන සමයේ ද මේ සංකල්පය පොදු ජනතා සිත් සතන් තුල අඩු නොඅඩුව පැළපදියන් වී තිබුණි. රටේ අධ්‍යාපන ක්‍රමය සැකසී තිබුණේ ද ඒ අදහස ස්වුඨ වන ආකාරයට ගමේ පාසලේ දක්ෂ සිසුන්ට ශිෂ්‍යත්ව දී නගරයට අද්දවා ගැනීම පෙරදැරිණි කරගෙන ය.

කොළඹ කිරිණි වුවද, "දිය කිරි" ණි සහ "මිටි කිරි" වශයෙන් දෙවර්ගයක් ඇති බව දන්නේ, දන්නෝ පමණි. ගමේ කැකිරිණි පවා, "සාමාන්‍ය පිපිඤ්ඤා" සහ "සීනි කැකිරි"ණිවශයෙන් තවත් වර්ගී කරණය කරන්නට හැකි බව අපට වැටහුනේ ද, පසු කලෙක "පොකුරු පාසල්" වැනි ජාතික ධනයේ බෙද හැරීම අසමමිතික කරවන සංකල්ප රාජ්‍ය අනුග්‍රහයෙන් දෙරට වැඩැම්මවූ සමයට ඉතා කලිනි.

ගමේ "සීනි කැකිරි" පාසලක ඉගෙනුම ලබා නමවැනි ශ්‍රේණිය අවසානයේ දී පැවති ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාගය ඉහලින් සමත් වූ මා, එපින් බලෙන් කොළඹ පිහිටි "මිටි කිරි" පාසලක් යැයි සම්මත ආනන්දයේ ඉගෙනුම ඇරඹුවේ දහසක් බලාපොරොත්තු මැද බව අමුතුවෙන් කිව යුතු නැත.
අප දහවැන්න සඳහා ආනන්දයට ආවේ එහි වසර දෙකක් ඉගෙනුම ලබා ජාතික උසස් අධ්‍යාපන සහතික පත්‍ර විභාගය සඳහා පෙනී සිටිමටයි. එය එවකට පැවති සහ අද ද පවතින අපොස උසස් පෙල විභාගය සඳහා වූ ආදේශකය විය.

මේ නව පාඨමාලාව සඳහා විෂයය නිර්දේශ, පාඩම් පොත් යනාදිය ඒ වන විට මනාව සැකසී තිබුණ ද, එක් ප්‍රායෝගික ගැටළුවක් උද්ගතව තිබුණි. එනම්, අළුත් දහයේ පන්තිවලට ඉගැන්වීම සඳහා උසස් පෙළ උගන්වන ගුරුවරුන් ඇති තරම් අනුයුක්ත කිරීමට පාසල්වලට නොහැකි වීමයි.

උසස් පෙල සඳහා උගන්වන්නේ උපාධිධාරී ගුරුවරුන් ය. ඔවුන් සිටියේ ඉතා අඩු සංඛ්‍යාවකි. එවකට පැවති අපොස උසස් පෙල විෂයය නිර්දේශයේ පන්ති ද, ඊට අමතරව, අපේ අළුත් විෂයය නිර්දේශයේ අපට කලින් වසරේ පන්ති ද ඒ වන විට පැවත්වුණි.

මෙනිසා, පැරණි විෂයය නිර්දේශයේ සාමාන්‍ය පෙල පන්ති සඳහා ඉගැන්වූ ගුරුවරුන් අපේ පන්තිවලට අනුයුක්ත කිරීම හැර වෙන විකල්පයක් පාසලට නොවීය.

ආනන්දයේ අප ගත කළ මුල් වසරක පමණ කාලය සියළු දෙනාටම ඉතා අකාර්‍යක්ෂම කාල වකවානුවක් වූවේ යැයි මම සිතමි. එය පාසලේ වරදක් ද, ගුරුවරුන් ගේ වරදක් ද, අපේ වරදක් ද, ආණ්ඩු පෙරලියක් හා බැඳුණු වෙනස්කම් නිසා ඇතිවූවක් ද යන්න නිසි ලෙස තීරණය කළ නොහැක. ප්‍රධාන වශයෙන්ම ගුරුවරුන් සම්බන්ධ කරුණු නිසා ඒ කාලකණ්ණිණි තත්වය ඇති වූයේය යන්න සැබෑවකි. නමුත්, අඩු වැඩි වශයෙන් පෙරකී සියළු කරුණු සියල්ලම ඒ තත්වය උත්ගත වීමට සහ දිගින් දිගට ඇදී යාමට බලපෑවේය යන්න වඩා හොඳ පැහැදිලි කිරීමක් වේ.

අපට රසායන විද්‍යාව ඉගැන්වූ ගුරුවරයා මෙහිදී මුලින්ම මගේ මතකයට එයි. සතියකට දෙතුන් වරක් යෙදුණු ඔහුගේ පාඩම් වාර සැමදම යෙදී තිබුණේ එක්කෝ උදේ පාන්දරම හෝ නැතිනම් දහවල් විවේකයෙන් පසුව දැ යි මට හරියටම කිව නොහැක. කෙසේ වුවත්, ඔහු පන්තියට පැමිණි වෙලේ සිට කලේ දිගින් දිගටම ඇනුම් ඇරීමයි. එක් දිනක් මා ගණන් කළ පරිදි ඔහු එක් පැයක කාල පරිච්ඡේදයක් තුල ඇනුම් විසි එකක් ඇරියේය. එනම්, සෑම විනාඩි තුනකටම එක ඇනුමකි.

කාමරයක සිටින එක් අයෙකුට ඇණුමක් ගිය විට, ඒ අසල සිටින අයටද ඇනුම් යාමේ ප්‍රවණතාවක් ඇති බව ලොව පතල කරුණකි. ඒ පැයක කාලය තුල පන්තියේ සිටි සිසුන් තිස් දෙනාද ඇනුම් හැටක්වත් අරින්නට ඇත. අපේ රසායන විද්‍යාව පාඩම් ඒ තරම්ම රසවත් විය!

ජීව විද්‍යා ගුරුවරයා නම්, විෂයය නිර්දේශයට අනුව පාඩම් ඉගැන්වීම සිදු කළ අතර, මැතිවරණ සමයේ ඔහු සියරට පත්තරේ පල කළ ලිපි අපට පෙන්වා තම පාක්ෂිකත්වය ද හෙළි කර සිටියේය. මැතිවරණයෙන් පසු අමාත්‍යංශයේ නිලයක් ලද නිසා දෝ ඔහු නොපෙනී ගියෙන් අපට එතැන් පටන් පලපුරුදු උසස් පෙල ගුරුවරියක ගේ සේවය ලැබුණි.

අපේ භෞතික විද්‍යා ගුරුවරයා එකල ගුවන් විදුලි වැඩසටහන් වලටද, පසුව රූපවාහිනී වැඩ සටහන් වලටද සහභාගී වූ තරමක ප්‍රසිද්ධ පුද්ගලයෙකි. ඔහු පුවත් පත් වලට විද්‍යා පාඩම් ද ලිවීය. නමුත් සරල පාඩම් දෙක තුනක් කියා දීම හැර ඒ වසර තුලම ඔහු ඉගැන්වූ දෙයක් නැති බව අපට අවසානයේ වැටහුණි. මෙයට විශාල වශයෙන් වග කිව යුත්තේ ආනන්ද විදුහලේ නේවාසිකව සිටි පරවියන් බවද කිව යුතුය.

අපේ පන්තිය පිහිටියේ ආනන්දයේ මරදාන බොරැල්ල මාර්ගයට සමාන්තරව පිහිටුවා ඇති එක් තෙමහල් ගොඩනැගිල්ලක ඉහල මාලයේ ය. මේ ගොඩනැගිලිවල වහලය සහ සීලිම අතර ඇති විශාල අවකාශයේ අනාදිමත් කාලයක සිට "ආනන්ද ලකුණ" දරණ පරවියන් ජීවත්ව සිට ඇත.

පාසලට පැමිණාණි දින සිටම, විටින් විට අහසේ සරණ පරවියන් අප දැක තිබුණ ද උන් ජීවත්ව සිටින තැන පිළිබඳව අපට නිවරදව වැටහුනේ, අපේ පන්ති කාමරයේ සීලිමේ හතරැස් කොටසක් කැඩී බිමට වැටුණු දින ය.

ඒ විවරය තුලින් හමා ආ කුණු ගන්දස්කාරය නිසා, පරවියන් කෙතරම් කාලයක් සීලිම සහ වහලය අතර පිහිටි මේ විශාල ප්‍රදේශය තම නිජ බිම ද, වැසිකිලිය ද කරගෙන සිටින්නට ඇතිද යන්න පිළිබඳව අපට මනා අවබෝධයක් ලැබුණි.

මුල් දින දෙක තුන තුල අපට ඔක්කාරය එන තරමට මේ දැඩි දුර්ගන්ධයක් දැනුණද, ඉන් පසු අප සියළු දෙනා එයට අනුවර්තනය වීමු. අපට ඒ හැර අන් විකල්පයක් තිබුනේ ද නැත. විකල්පයක් තිබු එකම පුද්ගලයා වූයේ අපේ භෞතික විද්‍යා ගුරුවරයායි. මේ දුර්ගන්ධය නැතිවන තුරු අපේ පන්තියට ඉගැන්වීම ඔහු වර්ජනය කළ අතර, අඩි හතරයි හතරේ ඇස්බැස්ටෝස් තහඩුවකින් හෝ ලෑලි කෑලි කීපයකින් හෝ විසඳන්නට හැකිකම තිබු මේ ප්‍රශ්ණය නොසලකා හැර සිටීමෙන් විදුහල් පරිපාලනය ද අපේ භෞතික විද්‍යාව ගුරුවරයාට කෙලින්ම සහය දැක්වීය.

මේ සිදුර වහන්නට පාසලට මාස තුනකටත් වඩා වැඩි කාලයක් ගතවුණු බව මගේ මතකයයි.

නුවර ප්‍රදේශයේ හොඳ මිටි කිරි පාසලක සිට කොළඹ වඩා හොඳ කිරි සොයා පැමිණි සිටි එක් සිසුවෙක් මේ අවස්ථාව ප්‍රයෝජනයට ගෙන දෝ පාසලෙන් අස්වී නැවතත් තම මුල් පාසල බලා ගියේය.

ගුරු ප්‍රශ්ණ නිසා, අපේ පන්තියේ සිසුන් දහවන ශ්‍රේණියේ භෞතික විද්‍යාව නිසි ලෙස ඉගෙන ගන්නට ඉඩකඩ නොලැබුණද, විද්‍යා විෂයය ධාරාවේ අනෙක් දහවැනි පන්ති අටේ සිටි සිසුන්ට නම් එවැනි ප්‍රශ්ණ ඇතිවී නොතිබුණි. අපට ඒ බව හොඳින් වැටහුනේ, දහවැන්නේ ඉගෙනුම අවසානයේ පැවති විභාගයට මුහුණ දෙන අවස්ථාවේ දී ය.

භෞතික විද්‍යාව මුල් ප්‍රශ්ණ පත්‍රය බහුවරණ වර්ගයේ ප්‍රශ්ණ හතලිහකින් සමන්විත වූ එකකි. ගුරු වර්ජනයෙන් බැට කා සිටි මගේ භෞතික විද්‍යාව දැනුම කෙතරම් අඩු වූයේ ද යත්, ඒ ප්‍රශ්ණ පත්‍රයේ ප්‍රශ්ණ අති විශාල බහුතරයක අන්තර්ගතය ගැන මට කිසිදු වැටහීමක් නොතිබුණි.

රචනා විලාශයේ දෙවන ප්‍රශ්ණ පත්‍රයට මුහුණ දෙන්නට පෙර තිබු විවේකයේ දී අපට වැටහුනේ පන්තියේ සියළු දෙනාම සිටින්නේ එකම බෝට්ටුවේ බවයි.

කළ යුත්තේ කුමක්දැයි අපි සාකච්ඡා කළෙමු. තීරණයක් ගැනීම ඉතා පහසු විය.

අපේ පන්තියේ සිසුවෝ භෞතික විද්‍යාව දෙවන ප්‍රශ්ණ පත්‍රය වර්ජනය කළ හ.

අපේ ගුරුවරයා අපට කලින්ම ආදර්ශය දී තිබුණා නොවැ!

එසේ වුවද, පලමු ප්‍රශ්ණ පත්‍රයට ඒ වන විට පිළිතුරු දී තිබුණු නිසා අවසානයේ මට භෞතික විද්‍යාව සඳහා ලකුණු දහයක් ලැබී තිබුණි. ඒ වනාහී ප්‍රශ්ණ හතලිහක බහුවරණ ප්‍රශ්ණ පත්‍රයකින් කණා මුට්ටිය බිඳින ආකාරයෙන් වුව ලබා ගත හැකි ලකුණු ප්‍රමාණයකි. එය මා ලද ජීවිතයේ විෂයයකට ලද අවම ලකුණු ප්‍රමාණය ද විය.





